ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2263/5 - 2022 ජනවාරි මස 19 වැනි බදාදා - 2022.01.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය

1948 අංක 13 දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත 1934 පෙබරවාරි 05 වැනි දින දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 51 වගන්තිය යටතේ වූ නිවේදනය

**නිවේදනය**

කලින් කල සංශෝධිත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ, 2අඅ හා 17 වැනි වගන්ති සම්පූර්ණයෙන් ඉවත් කර පහත නව වගන්ති ආදේශ කිරීමෙන් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

2අඅ - "මේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මෙහි 'ට' උපලේඛනයේ නිශ්චිතව සඳහන් ධූරයකට හෝ තනතුරකට, රාජ්‍ය සේවයට පිටතින් පත් කරනු ලැබූ ද එකී ධූරය හෝ තනතුර මාස එකසිය විස්සක් හෝ ඊට වැඩි කාලයක් දැරුවා වූ ද යම් තැනැත්තෙකු එකී ධූරය හෝ තනතුර ස්ථිර ධූරයක් හෝ තනතුරක් වුව ද නොවුව ද, අවුරුදු 10 කාලයක් සඳහා ඔහුගේ වැටුපෙන් 1/3 කට සමාන වූ ද ඊට පසුව අවුරුදු දහයට වැඩි එක් එක් සම්පූර්ණ සේවා අවුරුද්ද වෙනුවෙන් වැටුපෙන් 1/30 පංගුව බැගින් වැඩිවෙමින් සේවා අවුරුදු 20ක් වෙනුවෙන් අවසාන වරට ලැබූ වැටුපෙන් 2/3ක උපරිමය දක්වා වූ ද විශ්‍රාම වැටුපක්, අකාර්යක්ෂමතාව හෝ විෂමාචාරය මත හැර වෙනත් යම් හේතුවක් නිසා ඔහුගේ සේවය අවසාන වීමේ දී ලැබීමට හිමිකම් ලැබිය යුතුය. ඉහත 2අඅ වගන්තිය යටතේ විශ්‍රාම වැටුපක් ගෙවනු ලැබිය යුතු යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් පරිවර්තිත පාරිතෝෂිකයක් ගෙවනු නොලැබිය යුතුය.

එසේ වුව ද විශ්‍රාම වැටුපක් ලබන රජයේ නිලධරයෙකු හෝ විශ්‍රාමලත් නිලධරයකු 'ට' උපලේඛනයේ සඳහන් තනතුරකට පත් කරනු ලැබ එහි සඳහන් තනතුරු එකක් හෝ වැඩි ගණනක අවුරුදු 10ක අඛණ්ඩ, අවම සේවා කාලයක් සම්පූර්ණ කරන ලදුව ඒ තනතුරු එක හෝ වැඩි ගණන, දැරීම නතර වූ විට —

(අ) ඔහුගේ විශ්‍රාම වැටුප නිශ්චය කිරීමේ කාර්යය සඳහා, රජයේ නිලධරයෙකු, වශයෙන් වූ ඔහුගේ සේවාවන් සහ 'ට' උපලේඛනයේ සඳහන් අවසන් තනතුරේ ලැබූ වැටුප සැලකිල්ලට ගනිමින් 2අඅ වගන්තියෙහි සඳහන් පදනම මත විශ්‍රාම වැටුපක් ලැබීමේ මනාපය ඔහු සතු වන්නේ ය;

1A - G35857 — 15 (2022/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) ඔහුගේ ප්‍රතිශෝධිත විශ්‍රාම වැටුප නිශ්චය කිරීමේ කාර්යය සඳහා රජයේ නිලධරයෙකු වශයෙන් වූ ඔහුගේ සේවාවන් සහ 'ට' උපලේඛනයේ සඳහන් අවසන් තනතුරේ ලැබූ වැටුප සැලකිල්ලට ගනිමින් 2අඅ වගන්තියෙහි සඳහන් පදනම මත ඔහුගේ විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කිරීමේ මනාපය ඔහු සතු වන්නේ ය.

(ඇ) රජයේ සේවයේ අවුරුදු 10ක අවම සේවයක් ඇත්තා වූද 'ට' උපලේඛනයේ සඳහන් තනතුරකින් විශ්‍රාම ලබන්නා වූ ද තැනැත්තෙකු සම්බන්ධයෙන් වන විට, 2අඅ වගන්තිය හෝ රජයේ නිලධරයෙකුට අදාළවන රීති සහ ඔහුගේ අවසන් වැටුප යන දෙකින් ඔහුට වඩා වාසිදායක එක පදනම් කරගෙන ගණන් බලන ලද ඔහුගේ විශ්‍රාම වැටුප ලබා ගැනීමේ හෝ ප්‍රතිශෝධනය කිරීමේ මනාපය ඔහු සතු වන්නේ ය.

තව ද, එබඳු, අවස්ථාවක දී රජයේ නිලධරයෙකු වශයෙන් ඔහුගේ විශ්‍රාම වැටුප මත ඔහුට ගෙවන ලද යම් පරිවර්තිත පාරිතෝෂිකයක් ඔහුගේ කලින් විශ්‍රාම වැටුප් පදනම මතම අයකර ගනු ලැබිය යුතු ය".

17 -"පනස් පස් හැවිරිදි වයස පිරුණු විට හෝ ඉන් පසුව හෝ ආණ්ඩුවේ ඕනෑම සේවකයකුට ආණ්ඩුවේ සේවයෙන් විශ්‍රාම ගැනීමට නියම කරන්නට පුලුවන. නියම බලධාරි කෙනෙකු විසින් සේවයේ රඳවා ගැනීමට තීරණය කළහොත් මිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හෝ වෙනත් නීතියක් මගින් හෝ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස නිශ්චිතව තීරණය කර ඇති නිලධරයන්ට හැර, සියලුම සිවිල් රාජ්‍ය නිලධරයන් හැට පස් වයස පිරුණු විට අනිවාර්යයෙන්ම සේවයෙන් විශ්‍රාම ගත යුතුය".

මෙම තීරණය 2022.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වුවා සේ සැලකිය යුතු ය.

**ජනක බණ්ඩාර තෙන්නකෝන්,**
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.

වර්ෂ 2022 ක් වූ ජනවාරි මස 12 වැනි දින,
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

EOG 01 - 0193

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.